# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1799/9 - 2013 පෙබරවාරි මස 27 වැනි බදාදා - 2013.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත

### 2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම් කොටස්, මූල්‍ය හා පරිපාලන ආයතන සංවර්ධනය කිරීමේ නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා වහා අවශ්‍ය වී ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 පෙබරවාරි මස 26 වැනි දින,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 514බී, රාජගිරිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ පිහිටි අංක CO/KTT/2008/400 දරන ප්‍රගමණ අනුරේඛනයෙහි කැබලි අංක A සහ B මගින් දක්වා ඇති ශ්‍රී ජයවර්ධනපුර මාවතේ වරිපනම් අංක 300 හා 294 දරන ඉඩම්,

ඉඩම් කොටස් සඳහා මායිම් පහත දැක්වේ.

**කැබලි අංක A - ප්‍රමාණය හෙක්ටයාර් 1.2072**

| | | |
|---|---|---|
| උතුරට | : | රෝයල් ගාඩ්න්ස් පාර, කැබලි අංක B සහ ශ්‍රී ජයවර්ධනපුර මාවත ; |
| නැගෙනහිරට | : | ශ්‍රී ජයවර්ධනපුර මාවත සහ කොළොන්නාව ඇල ; |
| දකුණට | : | කොළොන්නාව ඇල සහ කොන්ක්‍රීට් කාණුව ; |
| බටහිරට | : | කොන්ක්‍රීට් කාණුව, රෝයල් ගාඩ්න්ස් පාර සහ කැබලි අංක B. |

1A - G 17350 — 340 (2013/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කැබලි අංක B - ප්‍රමාණය හෙක්ටයාර් 0.0959**

| | | |
|---|---|---|
| උතුරට | : | රෝයල් ගාඩින්ස් පාර සහ ශ්‍රී ජයවර්ධනපුර මාවත ; |
| නැගෙනහිරට | : | ශ්‍රී ජයවර්ධනපුර මාවත සහ කැබලි අංක A ; |
| දකුණට | : | කැබලි අංක A ; |
| බටහිරට | : | කැබලි අංක A සහ රෝයල් ගාඩින්ස් පාර. |

03-632

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.